# පළමු පරිච්ඡේදය

## 1.1. හැඳින්වීම

කලාවෙන් සිදුවනුයේ මිනිසා සහ ලෝකය අතර සම්බන්ධය එක්තරා ආකාරයකට ප්‍රතිනිර්මාණය කිරීම නැතහොත් අතික්‍රමණය කිරීමක් ලෙස හැඳින්විය හැක. අවම වශයෙන් මිනිසා හා ලෝකය අතර සම්බන්ධය පසක් කර ගැනීම වශයෙන් දැක්වීමට පුළුවන. කලාව හැරුණු කොට, ආගම හරහාද සිදුවන්නේ මෙයයි. වෙනස ඒ සඳහා භාවිත මානයන්හි වෙනස්කමයි. ආගමික දර්ශනයක් පදනම් කොට ගෙන ලෝකය, ස්වභාව ධර්මය, ජීවිතයේ අර්ථය, සමාජයේ ඉදිරි ගමන, සමාජයේ එම පුද්ගලයාට පැවරී ඇති මෙහෙවර ඇතුළු නන්විධ වූ ප්‍රපංචයන් පිළිබඳව පසක් කර ගැනීමට උත්සහ ගන්නේ නම් එය ආගමික දෘෂ්ටියකින් ලෝකය දෙස බැලීමකි. තාර්කික හා සබුද්ධික ලෙසින් හැඟීම් පද්ධතිය බැහැර කොට මෙකී පසක් කර ගැනීම කරනු ලබන්නේ නම් එය විද්‍යාත්මක දෘෂ්ටියකින් ලෝකය දෙස බැලීමකි. මීට අමතරව විවිධ දාර්ශනිකයින් තම තමන් විසින් ගොඩනගා ගත් දර්ශනයන්ට අනුකූලව ලෝකය තේරුම් ගැනීමට උත්සහ කරනු ලබයි. උදාඃ මාක්ස් වැන්නවුන් දැක්විය හැක. කලාකරුවාට මෙම නන්විධ වූ දෘෂ්ටීන්හි ආලෝකය ලැබිය හැකි වුවද ඔහුගේ දෘෂ්ටිය මේ සියල්ලෙන් වෙනස් වෙයි. මෙම වෙනස හඳුනාගැනීමෙහි පදනම වශයෙන් විද්‍යාත්මක හා කලාත්මක දෘෂ්ටිය සැසඳීම වඩා වැදගත් යැයි සිතමි. උදාහරණයක් ලෙස විද්‍යාත්මකව මලක් දෙස බලන පුද්ගලයා එය අවබෝධ කොට ගනුයේ එය කොටස් වලට කඩා විශ්ලේෂණය කිරීමෙනි. එහි වර්ණ, සුවඳ නිර්මාණය වීම සඳහා වූ රසායනික සංයුතිය විමර්ශනය කොට එය සූත්‍රගත කරනු ලබයි. එහිදී වේදක හා වේදිතය වෙන් වෙන් වශයෙන් හඳුනාගනු ලබයි. එනම් මල හා පුද්ගලයා වෙන් වෙන්ව ගැනීමෙනි. නමුත් කලාත්මක දෘෂ්ටිය සහිත පුද්ගලයා මල තේරුම් ගනුයේ බාහිරව තිබෙන දෙයක් ලෙස එය ඉවත් කිරීමෙන් නොව මල වේදකත්වයට පත් කිරීම තුළිනි. එනම් ආත්ම ජීවිත පද්ධතියට සම්බන්ධ දෙයක් ලෙස ගෙන විශ්ලේෂණය කිරීමෙනි. නාට්‍යකරුවෙකු තම නිර්මාණයන් උදෙසා පාදක කරගනු ලබන වස්තු විෂයද මල තේරුම් ගැනීමට කරන උත්සහයට සමාන කොට දැක්විය හැකිය.

විද්‍යාවෙහිදී තිබෙන යථාර්ථය ඒ අයුරින්ම පරාවර්තනයක් ලෙස ඉදිරිපත් කෙරේ. එහිදී දැකිය හැක්කේ ආධ්‍යාත්මිකත්වයෙන් තොර හුදු භෞතිකත්වයක් පමණි. නමුත් කලාකරුවාට මෙකී භෞතිකත්වය මෙන්ම ආධ්‍යාත්මික සීමාව ද ග්‍රහනය වේ. ඕනෑම භෞතික වස්තුවක් වෙතට මානව අවධානය යොමු වූ කල එහි ආධ්‍යාත්මික විපර්යාසයක් සිදුවේ. ඒ හරහා එය සමාජ ජීවිතය පිළිබඳව කෙරෙන ඉගැන්වීමක් බවට පත්වේ. මේ අනුව මානව සාධකයන්හි බලපෑමෙන් එය සංස්කෘතියෙහි කොටසක් බවටද පත් වෙයි. කලාවේදී

සිදුවන්නේද මෙයයි. කලාකරුවා ඔහු දරන දෘෂ්ටියට අනුගතව බාහිර පරිසරයද තමාට අනුව සකස්කර ගැනීමට ප්‍රයත්න දරයි. එහිදී සමාජ යථාර්ථය අපට දෙන ලද තත්වයන් මත යම් ආකාරයකට නිර්මාණය කිරීම ඔහු විසින් සිදු කරනු ලබයි. මේ අනුව කලා නිර්මාණයක් හරහා ප්‍රකට වනුයේ එය නිර්මාණය කරනු ලබන කලාකරුවා ජීවිතයේ අර්ථය, සමාජයේ ඉදිරි ගමන, සමාජයේ ඔහුට පැවරී ඇති මෙහෙවර, ස්වභාව ධර්මය, මනුෂ්‍යයා ලෝකය ආදි ප්‍රපංචයන් පිළිබඳව ඔහු දරන්නා වූ දෘෂ්ටියයි. එකම නිර්මාණ කරුවෙකු අතින් නිර්මාණ රාශියක් බිහිවන කල ඒවායෙහි බොහෝ විට යම් සාම්‍යත්වයක් විශද වනුයේ කලාකරුවගේ මුඛ්‍ය දෘෂ්ටිය ඔහු දැනුවත්ව හෝ නොදැනුවත්ව තම නිර්මාණයන් තුළට කිඳා බසින බැවිනි.

නමුත් පුද්ගලයාගෙන් පුද්ගලයාට දෘෂ්ටියෙහි තලයන් වෙනස් වෙයි. උදාහරණයක් ලෙසට අයෙකුට මලක් ගැඹුරු දාර්ශනික වස්තුවක් විය හැකිවාක් මෙන්ම කෙනෙකුට එය සුන්දරත්වයෙන් යුත් ස්වභාවික වස්තුවක් පමණි. එසේම යම් සමාජ සංසිද්ධියක්, චිත්‍රපටියක් හෝ රූපවාහිනි වෙළඳ දැන්වීමක් දෙස බලා එය කියවන ආකාරය (Read) පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. එයට පුද්ගලයාගේ වයස, සමාජ වටපිටාව, අත්දැකීම් ආදි බාහිර සාධක ගණනාවක් බලපානු ලැබේ. මේ අනුව කලාකරුවාට ද සමාජයේ විවිධ ප්‍රපංචයන්, සංසිද්ධීන්, ක්‍රියාවලීන් දෙස බලන ආකාරයේ විවිධ තල තිබිය හැකිය. ඒ අනුව කලාකරුවෙකුගේ දෘෂ්ටිය විමසා බලන කල ඔහුගේ සමාජ වටපිටාව ආදි බාහිර සාධක පිළිබඳව අධ්‍යයනයක් කිරීම වැදගත් වේ. ඒ අනුව මෙම නිබන්ධනයේදී ජයලත් මනෝරත්නයන්ගේ නාට්‍ය දෘෂ්ටිය විමසීමේදී ඔහුගේ පසුබිමද අධ්‍යයනය කිරීම වැදගත් වූවක් ලෙස සලකමි.

පුද්ගලයාගෙන් පුද්ගලයාට දෘෂ්ටියෙහි තලයන් වෙනස් වුවද කලාකරුවාට අන් අය අභිබවා ගිය ගැඹුරු දැනීමක් තිබිය යුතුයි. මක්නිසාද යත් සමාජය හා මනුෂ්‍ය ජීවිතය බෙහෙවින් සංකීර්ණ වන බැවින් එය විනිවිද යා හැක්කේ ඔහුගේ දෘෂ්ටිය නිසාවෙන් වන බැවිනි. බුද්ධිය, සංවේදීතාව, අනෙකා පිළිබඳව පවතින ගැඹුරු සහනුභූතිය (Empathy) හේතුවෙන් කලාකරුවා අනෙකා බවට පත්වේ. ඒ අනුව එය බාහිරින් කෙරෙන හඳුනාගැනීමක් නොවන බවත් පරිකල්පනය (Imagination) හරහා වේදකයා බවට පත්වීම තුළින් සිදුවන බවත් දැකගත හැකිය. ඒ අනුව කලාකරුවා තම මනසේ පරිකල්පිත චිත්‍රය හරහා තම දෘෂ්ටිය සමාජගත කරනු ලබයි. ඒ සඳහා ඔහු චිත්‍රපටිය, ගීතය, වේදිකා නාට්‍ය, නවකතාව, කෙටිකතාව ආදි කලා මාධ්‍යයන් අතරින් තමාගේ දෘෂ්ටිය වඩා හොඳින් හා පහසුවෙන් ගෙන යා හැකි කලා මාධ්‍යයක් තෝරා ගනී.

ජයලත් මනෝරත්න වූ කලී වේදිකා නාට්‍ය, සාහිත්‍යය, රූපවාහිනිය, සිනමාව ආදි නන්විධ වූ කලා මාධ්‍යයන් රැසක නියුක්ත කලාකරුවෙකි. එහිදී ජයලත් මනෝරත්න නම්

කලාකරුවාගේ දෘෂ්ටිය විමසා බැලීමේදී ඔහුගේ සමස්ත නිර්මාණ අධ්‍යයනය කළ යුතුය. නමුත් ඔහු පිළිබඳව කරන ලද අධ්‍යයනයේදී, කලා මාධ්‍ය රැසක නියුක්ත වුවද ඔහුගේ ප්‍රධාන කලා මාධ්‍ය ලෙස වේදිකා නාට්‍ය හඳුනාගත හැකි විය. විශේෂයෙන්ම ඔහු සමඟ කළ සම්මුඛ සාකච්ඡාවේදී ද ඔහු විසින් ඔහුගේ ප්‍රධාන කලා මාධ්‍ය ලෙස හඳුන්වා දෙනු ලැබුවේද වේදිකා නාට්‍යයයි. එසේම වෙනත් කලා මාධ්‍යයන්හිදී ද තම දෘෂ්ටිය ප්‍රකට කරවීමට තරම් ඉඩහසරක් නොලැබෙන බවද ඔහුගෙන් වැඩිදුරටත් ප්‍රකාශ විණි. එමෙන්ම දශක පහක් පුරාවට විවිධ කලා මාධ්‍යයන් වල නිරත වී සිටියද වර්තමානය වන තෙක් වේදිකාව අත්නොහැර සිටින කලාකරුවෙක් වීම තුළින්ද ඔහු වේදිකාවට දක්වන ප්‍රමුඛස්ථානය අවබෝධ කොටගත හැකිය. රූපන ශිල්පියෙකු, නාට්‍ය නිෂ්පාදකවරයෙකු * මෙන්ම නාට්‍ය රචකයෙකු වීම නිසාවෙන් නාට්‍ය කලා ක්ෂේත්‍රය තුළ ඔහුගේ දායකත්වය පරිපූර්ණය. මේ වන විට නාට්‍ය නිර්මාණ දහයක් ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවට එක්කර ඇති ඔහුගේ නාට්‍ය අතරින් අටක්ම ස්වතන්ත්‍ර නාට්‍ය වෙයි. ඉන් දෙකක් පමණක් පරිවර්තන නාට්‍යයන් වෙයි. මේ අනුව ශ්‍රී ලාංකීය නාට්‍ය ක්ෂේත්‍රයට කර ඇති දායකත්වය නිසාම මෙවන් ප්‍රාමාණික නාට්‍යකරුවෙකුගේ නාට්‍ය දෘෂ්ටිය විමසීම වැදගත් කමක් දරයි. එදිරිවීර සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන, ගුණසේන ගලප්පත්ති, සුගතපාලද සිල්වා, හෙන්රි ජයසේන ආදි පුරෝගාමී නාට්‍ය කරුවන්ට පසුව බිහිවූ සුවිශේෂි නාට්‍යකරුවෙක් ලෙස බොහෝ අය විසින් ජයලත් මනෝරත්නව හඳුන්වා දෙනු ලැබෙයි. එමෙන්ම වත්මන් අ.පො.ස. (සා.පෙළ) නාට්‍ය හා රංගකලා විෂය සඳහා නිර්දිෂ්ට නාට්‍ය කෘතියක් ලෙස ඔහුගේ "තලමල පිපිලා" නාට්‍ය තෝරා ගෙන තිබීම ආදි කාරණාද නාට්‍යකරුවෙකු වශයෙන් ඔහුගේ නිර්මාණ පිළිබඳව විමසා බැලීමට පෙළඹුමක් ඇති කරවන්නකි. එබැවින් මෙවන් අධ්‍යයනයක් කාලීන වශයෙන්ද වැදගත්කමක් දරණ බව පෙනී යයි.

නාට්‍ය කලාවේදී වේදිකාව නම් වූ භෞතික ප්‍රපංචය මූලික කරගෙන රංගනමය, භාෂාමය, හා චලන තුළින් මතු කෙරෙන සංඥා හරහා විවිධ අරුත් ඉදිරිපත් කරයි. එහිලා යථාර්ථයේ වූ සංකීර්ණ, ප්‍රතිවිරෝධතා, සමවිෂමතාවයන්, බාහිර හා අභ්‍යන්තරික වශයෙන් ඇති යම් යම් ගතිකයන් නාට්‍යමය ස්වරූපයෙන් ඉදිරිපත් කෙරේ. ඒ අනුව නාට්‍ය කලාව නිර්මාණකරුවාගේ දෘෂ්ටිය සමාජගත කළ හැකි අපූර්ව කලා කෘතියක් බවට පත්වේ. විශේෂයෙන්ම එය මිනිසා පිළිබඳ කලාවකි. මෙම නිබන්ධනයේදී ජයලත් මනෝරත්නයන්ගේ දෘෂ්ටිය පිළිබඳව විමසා බැලීමට සුදුසුම කලා මාධ්‍ය ලෙස හඳුනාගත් වේදිකා නාට්‍ය තුළ ඔහු ප්‍රකට කරන දෘෂ්ටිය විමසා බැලීම සිදු කෙරේ.

* නාට්‍ය කලාවේදී එංගලන්තයේ භාවිතය අනුව නිෂ්පාදක වෙනුවෙන් ඇමරිකානු භාවිතය අනුව අධ්‍යක්ෂක යනුවෙන් හඳුන්වනු ලබන්නේ නිර්මාණ කාර්යට සහභාගී වන ප්‍රයෝක්තෘය.